# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2029/29 - 2017 ජූලි මස 26 වැනි බදාදා - 2017.07.26

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# IV (අ) වැනි කොටස - පළාත් සභා

## පළාත් සභා නිවේදන

### බස්නාහිර පළාතේ පළාත් සභාව

1989 අංක 12 දරන පළාත් සභා (ආනුශංගික විධිවිධාන) පනතේ 2 වන වගන්තිය සමග කියවිය යුතු 252 අධිකාරය වන මහා නගර සභා ආඥාපනතේ 268 වන වගන්තිය යටතේ පළ කරනු ලබන නිවේදනය

252 අධිකාරය වන මහා නගර සභා ආඥාපනතේ 272 (32) උප වගන්තියේ විධිවිධාන අනුව කොළඹ මහ නගර සභාව විසින් සාදනු ලදුව 1989 අංක 12 දරන පළාත් සභා (ආනුශංගික විධිවිධාන) පනතේ 2 වන වගන්තිය සමග කියවිය යුතු 252 අධිකාරය වන මහා නගර සභා ආඥාපනතේ 268 වගන්තිය යටතේ බස්නාහිර පළාතේ ප්‍රධාන අමාත්‍ය හා පළාත් පාලන විෂයභාර අමාත්‍යවරයා වශයෙන් මවිසින් අනුමත කරන ලද කොළඹ මහ නගර සභාවේ කොළඹ මහ නගර සභා බල ප්‍රදේශයෙහි වාහන ගාල් කර තැබීම නම් වූ මෙහි පහත උපලේඛනයේ සඳහන් අතුරු ව්‍යවස්ථාව, 1989 අංක 12 දරන පළාත් සභා (ආනුශංගික විධිවිධාන) පනතේ 2 වන වගන්තිය සමග කියවිය යුතු 252 අධිකාරය වන මහා නගර සභා ආඥාපනතේ 268 වන වගන්තියේ වැඩිදුරටත් සඳහන් විධිවිධාන අනුව 2017 ජුනි මස 06 දින බස්නාහිර පළාතේ පළාත් සභාව විසින් අනුමත කළ බව මෙයින් නිවේදනය කරමි.

ඉසුර දේවප්‍රිය,
බස්නාහිර පළාතේ, ප්‍රධාන අමාත්‍ය හා මුදල් හා ක්‍රමසම්පාදන,
ඉංජිනේරු සේවා, නීතිය හා සාමය, පළාත් පාලන හා පළාත් පරිපාලන,
ආර්ථික සංවර්ධන, විදුලිබල හා බලශක්ති, පරිසර කටයුතු,
ජලසම්පාදන හා ජලාපවහන සහ සංචාරක කටයුතු පිළිබඳ අමාත්‍ය.

2017 ජූලි මස 19 වැනි දින,
කොළඹ 07,
ශ්‍රාවස්ථි මන්දිරයේ පිහිටි,
බස්නාහිර පළාතේ, ප්‍රධාන අමාත්‍යාංශයේ දී ය.

### වාහන ගාල් කර තැබීම

1. මෙම අතුරු ව්‍යවස්ථා ''වාහන ගාල් කර තැබීමේ අතුරු ව්‍යවස්ථා'' යනුවෙන් හඳුන්වනු ලබයි.

2. කොළඹ මහා නගර සීමාව තුළ වාහන ගාල් කිරීම, ගාල් කිරීම තහනම් කිරීම, ගාල් කිරීම සඳහා නැවතුම් ස්ථාන ඇති කිරීම සහ විධිමත් කිරීම, ගාස්තු අය කිරීම සහ පැහැර හැරීම් පාලනය කිරීම සඳහා සහ ඊට අනුෂාංගික කරුණු සඳහා විධිවිධාන සලසා ගැනීම සඳහා පනවනු ලබන අතුරු ව්‍යවස්ථා වේ.

1A - PG 3625 — 11 (2017/07)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

3. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස, මෙම අතුරු ව්‍යවස්ථාවල ''නාගරික කොමසාරිස්'' යන්නට කොළඹ මහා නගර සභාවේ නාගරික කොමසාරිස් අදහස් වේ.

''වාහනය'', ''මෝටර් වාහනය'' ''මෝටර් ට්‍රයිසිකලය'', ''ද්විත්ව කාර්ය වාහන රථය'', ''මෝටර් ලොරිය'', ''සැහැල්ලු මෝටර් ලොරිය'', ''බර මෝටර් ලොරිය'', යන්නට මෝටර් වාහන පනත (203 අධිකාරිය) සහ එහි සංශෝධිත පනත් මගින් ලබා දී ඇති අර්ථයම අදහස් වේ.

''මෝටර් සයිකලය'', ''මෝටර් රථය'', ''බස් රථය'', ''මෝටර් කෝච් රථය'', යන්නට 1991 අංක 7 දරන බස්නාහිර පළාත් මෝටර් වාහන ප්‍රඥප්තිය හා එහි සංශෝධන පනත් මගින් ලබා දී ඇති අර්ථයම අදහස් වේ.

''ගාල්කිරීම'' යන්නෙන් වාහනයක් අචල තත්ත්වයකට ගෙන ඒම හෝ පුද්ගලයන් හෝ බඩු වහාම පටවා ගැනීම හෝ බැස්සවීම නොවන වෙනත් යම් කාර්යයක් සඳහා එය රඳවා ගෙන තැබීමට සැලැස්වීම හෝ අදහස් වේ.

''පාසැල් වෑන් රථය'' යන්නෙන් පාසැල් ළමුන් ප්‍රවාහනය කරනු ලබන ආසන 5 ට වැඩි 15 ට අඩු මෝටර් වාහනයක් අදහස් වේ.

''පාසැල් බස් රථය'' යන්නෙන් පාසැල් ළමුන් ප්‍රවාහනය කරනු ලබන ආසන 14 ට වැඩි මෝටර් වාහනයක් අදහස් වේ.

''රථවාහන පාලක'' යන්නෙන් වාහන ගාල් කිරීමේ පොදු බිම් කඩක ගාල් කිරීම සඳහා නාගරික කොමසාරිස්වරයා වෙනුවෙන් අවසර පත්‍ර නිකුත් කිරීමට එම කොමසාරිස්වරයා විසින් බලය පවරනු ලැබූ තැනැත්තෙකු අදහස් වේ.

''මාර්ග සංඥා'' යන්නට මෝටර් වාහන පනත (203 අධිකාරිය) සහ එහි සංශෝධිත පනත් මගින් ලබා දී ඇති අර්ථයම අදහස් වේ.

''වීථියක්'' යන්නට කොළඹ මහා නගර සභා සීමාව තුළ පිහිටි මහා නගර සභාව සතු හෝ මහා නගර සභාව විසින් නඩත්තු කරන යම් වීථියක්, පාරක්, මාර්ගයක්, මංමාවතක්, පටුමගක් හෝ මාර්ග ප්‍රවේශයක් ඇතුළත් වේ.

''අයිතිකරු'' යන්නෙන් මෝටර් රථ දෙපාර්තමේන්තුවේ ''අයිතිකරු'' ලෙස ලියාපදිංචි වී ඇති තැනැත්තාම අදහස් වේ.

''සභාව'' හෝ ''මහා නගර සභාව'' යන්නෙන් කොළඹ මහා නගර සභාව අදහස් වේ.

**තහනම් කිරීම**

4. (i) සභාවේ පරිපාලන සීමාව ඇතුළත, කිසියම් වීථියක හෝ වීථියක කොටසක හෝ වාහන ගාල් කිරීම නැතහොත් ගාල් කර තැබීම තහනම් කරන, සීමා කරන හෝ පාලනය කරන, එසේ නැතහොත් වාහන සඳහා වෙනු කරනු ලැබ ඇති කිසියම් වාහන ගාල්කිරීමේ ස්ථානයක් දක්වන දැන්වීම්, නාගරික කොමසාරිස්වරයා විසින් හෝ නාගරික කොමසාරිස්වරයාගේ නියමය ප්‍රකාර හෝ, ඒ වීථියෙහි නැතහොත් වීථියෙහි කොටසෙහි ප්‍රකට ස්ථානයක හෝ ඒ වීථියේ නැතහොත් වීථියේ කොටසෙහි සිට පෙනී යන ආකාරයට හෝ ප්‍රදර්ශනය කරනු ලැබිය යුතු ය.

(ii) මාර්ගයන්හි රථවාහන ගාල් කරනු ලබන ස්ථාන පිහිටුවීම ඉංජිනේරුමය න්‍යායන්ට හා පිරිවිතර වලට අනුකූලව වන සේ මාර්ගයන්හි සලකුණු පිහිටුවා කොළඹ මහා නගර සභාවේ ඉංජිනේරුමය කාර්යංශය මගින් ඉටු කරනු ලැබිය යුතු යි.

5. 4 වන අතුරු ව්‍යවස්ථාව යටතේ ප්‍රදර්ශනය කරන ලද දැන්වීමක් මගින්, කිසියම් වීථියක නැතහොත් වීථියක කොටසක වාහන ගාල් කිරීම තහනම් කරනු ලැබ ඇති අවස්ථාවක, වාහනයක රියදුරකු විසින් ;

(i) සභාවේ බලයලත් නිලධරයෙකු හෝ වෙනත් බලධරයකු විසින් ඒ වීථියේ හෝ වීථියේ කොටසක ඉදි කරනු ලැබ හෝ ප්‍රදර්ශනය කරනු ලැබ ඇති කිසියම් මාර්ග සංඥාවකට හෝ දැන්වීමකට හෝ පටහැනිව කටයුතු නොකළ යුතු යි.

(ii) ඒ වීථියේ හෝ වීථියේ කොටසෙහි ඒ අවස්ථාවේ පවත්නා කිසියම් වාහන ගමනා ගමනයක පිළිවෙල නිසි පරිදි අනුගමනය කළ යුතු යි.

එසේ වුවද,

I. කිසියම් තැනැත්තෙකුට එම වාහනයෙන් බැසීමට හෝ එම වාහනයට ගොඩවීමට ඉඩ දීම ; හෝ,

II. එම වාහනයට බඩු පැටවීමේ හෝ ඒ වාහනයෙන් බඩු බෑමේ කාර්ය සඳහා එම වාහනය එම වීථියේ හෝ වීථියේ කොටසෙහි මිනිත්තු 5 ක උපරිමයක කාලයක් සඳහා හැර ගාල් කිරීම නොකළ යුතු යි.

6. මෙම අතුරු ව්‍යවස්ථා යටතේ වූ වරදක් සම්බන්ධයෙන් කිසියම් නඩු පැවරීමක කාර්යය සඳහා 5 වන අතුරු ව්‍යවස්ථාව යටතේ හෝ නාගරික කොමසාරිස්වරයාගේ නියමය පරිදි හෝ ප්‍රදර්ශනය කර ඇතැයි කියනු ලබන, සභාවේ පරිපාලන සීමා ඇතුළත වූ සෑම දැන්වීමක්ම හෝ පාලන සංඥාවක්ම ඊට පටහැනිව කරුණු ඔප්පු කරනු ලැබුවහොත් මිස, නාගරික කොමසාරිස්වරයා විසින් නීත්‍යානුකූලව ප්‍රදර්ශනය කරනු ලැබ ඇති ලෙස සලකණු ලැබිය යුතු ය.

**මෝටර් වාහන ගාල් කර තැබීම**

7. මෝටර් වාහන ගාල් කිරීම සඳහා ගාස්තුවක් අය කර මෝටර් වාහන හෝ කිසියම් නිශ්චිත පන්තියක නැතහොත් වර්ගයක මෝටර් වාහන හෝ ගාල් කර තැබීම සඳහා නාගරික කොමසාරිස්වරයා විසින් නාගරික සීමාව ඇතුළත යම් ස්ථාන වෙන් කරනු ලැබිය හැකිය. එලෙස වෙන් කරනු ලබන ස්ථානයක් මෙම අතුරු ව්‍යවස්ථාවල ''වාහන ගාල්කිරීමේ පොදු බිම් කඩක්'' ලෙස හඳුන්වනු ලබයි.

8. කිසිම තැනැත්තෙකු, වාහන ගාල් කිරීමේ අවශ්‍යතාවයට හෝ වෙනත් රාජකාරි කරුණක් සඳහා හැර වාහන ගාල්කිරීමේ පොදු බිම් කඩකට ඇතුලු වීම හෝ, මෙම අතුරු ව්‍යවස්ථාවේ ප්‍රතිපාදන සලසා නොමැති වෙනත් යමක් එහි ගාල් කර තැබීම නොකළ යුතු ය.

9. මෝටර් වාහනයක්, වාහන ගාල් කර තැබීමේ පොදු බිම් කඩකට ඇතුලු කිරීම හෝ එහි ගාල්කිරීම, නගර සභාවේ බලයලත් නියෝජිතයෙකු / නිලධාරියෙකු විසින් නිකුත් කරනු ලබන ටිකට් පතක් හෝ අදාළ ගාස්තු ගෙවා ලබා ගත් වලංගු අවසරයක් හෝ නාගරික කොමසාරිස්වරයා විසින් ඒ සඳහා නිකුත් කරන ලද වලංගු අවසර පත්‍රයක් එහි රියදුරු සතුව ඇත්නම් මිස, එම රියදුරු විසින් එම බිම්කඩෙහි වාහනය ගාල්කිරීමට සැලැස්වීම කරනු නොලැබිය යුතු යි.

10. මෙම අතුරු ව්‍යවස්ථාව මගින් ආවරණය නොවන මගී ප්‍රවාහනය සඳහා යොදවා ඇති කුලී ත්‍රීරෝද රථ සඳහා මගීන් ගැනීම, බැස්සීම සම්බන්ධයෙන් වන නැවතුම් ස්ථාන ඇති කිරීම් සම්බන්ධයෙන් අවශ්‍ය විධිවිධාන කොළඹ මහා නගර සභාව විසින් සකස් කළ හැකි ය.

11. (i) 9 වන අතුරු ව්‍යවස්ථාව යටතේ නිකුත් කරනු ලබන එක් එක් අවසර පත්‍රය හෝ ටිකට් පතක් හෝ අදාළ ගාස්තු ගෙවා ලබා ගත් වලංගු අවසරයක් සඳහා මහා නගර සභාව විසින් යෝජනා සම්මතයක් මගින් තීරණය කොට ගැසට් පත්‍රයෙහි පළ කිරීමෙන් පසුව මෙහි I වන උප ලේඛනයේ දක්වා ඇති ප්‍රමාණයන් අනුව වූ ගාස්තුවක් අය කරනු ලැබිය යුතු ය. එකී ගාස්තු ප්‍රමාණයන් කලින් කළ සංශෝධනය කළ හැකි අතර එවැනි සංශෝධන ක්‍රියාත්මක කළ හැකි වනුයේ මහා නගර සභාව විසින් යෝජනා සම්මුතිය මගින් තීරණය කොට ගැසට් පත්‍රයේ පළ කිරීමෙන් පසුව වේ.

(ii) 9 වන අතුරු ව්‍යවස්ථාව යටතේ නිකුත් කරන ලද සෑම අවසර පත්‍රයක හෝ ටිකට් පතක හෝ අදාළ ගාස්තු ගෙවා ලබා ගත් වලංගු අවසරයක එය නිකුත් කරනු ලැබුවේ යම් මෝටර් වාහනයක් සම්බන්ධයෙන් නම් ඒ මෝටර් වාහනය හැඳින්වීමේ අංකය එහි සඳහන් විය යුතු අතර, එය අවසර පත්‍රයේ හෝ ටිකට් පත්‍රයේ හෝ ගාස්තු ගෙවා ලබා ගත් අවසරයේ සඳහන් කාල සීමාව සඳහා වලංගු විය යුතු ය.

(iii) 9 වන ව්‍යවස්ථාවේ දක්වා ඇති පරිදි වාහනය ගාල් කර තබන කාලය සඳහා වූ සම්පූර්ණ ගාස්තුව ගෙවා අවසර පත්‍රයක් හෝ ටිකට් පත්‍රයක් නිකුත් කොට ඇති අවස්ථාවකදී, එම අවසර පත්‍රය වාහනයේ ඉදිරිපස වීදුරුව තුළින් පැහැදිලිව පෙනෙන සේ ප්‍රදර්ශනය කර තැබිය යුතු යි.

(iv) ඉහත 11 (iii) අනුව අවසර පත්‍රය ප්‍රදර්ශනය නොකිරීම, ගාස්තු නොගෙවා ගාල් කර තැබීම හෝ අවසර ලබා ගත් කාලයට වඩා වැඩි කාලයක් ගාල් කර තැබීම නීත්‍යානුකූල නොවන අතර එවැනි අවස්ථාවකදී මෙහි II වන උපලේඛනයෙහි සඳහන් පරිදි ප්‍රමාද ගාස්තුවකට යටත් වේ.

(v) ඉහත සඳහන් පරිදි නීත්‍යානුකූල නොවන වාහන ගාල් කිරීමක් සම්බන්ධයෙන් එහි රියදුරුගෙන් හෝ අයිතිකරුගෙන් ප්‍රමාද ගාස්තු අයකර ගන්නා අතර එසේ නොගෙවූවහොත් එම රියදුරට හා/හෝ අයිතිකරුට විරුද්ධව පහත දක්වා ඇති පරිදි නඩු පවරනු ලැබිය හැකි ය.

(vi) නිසි ලෙස මුදල් ගෙවීමකින් තොරව ගාල් කරනු ලැබූ වාහනයක් හඳුනා ගැනීමෙන් පසු අදාළ රියදුරු සහ/හෝ අයිතිකරු වෙත, සභාව හෝ සභාව මගින් බලය පවරනු ලැබූ ආයතනයක් මගින් කරනු ලබන ප්‍රමාද ගාස්තු දැන්වීමකට අනුව එකී රියදුරු හා/හෝ අයිතිකරු ප්‍රමාද ගාස්තුවකට යටත් වන්නේ ය.

(vii) මෙම ප්‍රමාද ගාස්තුව ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන උපරිම මූල්‍යමය සීමාව ඉක්මවා ගිය වහාම හෝ ප්‍රමාද ගාස්තු දැන්වීම නිකුත් කළ දින සිට මාස 03 ක් ඉක්මවා හෝ යන දෙකෙන් පළමුව එළඹෙන අවස්ථාවේදී අදාළ මුදල් අයකර ගැනීම සඳහා නිසි අධිකරණයක නඩු පැවරිය හැකි ය.

12. ඉහත 11(iv) ව්‍යවස්ථාවට අනුව නීත්‍යානුකූල නොවන පරිදි ගාල් කරනු ලැබූ ගෙවිය යුතු ප්‍රමාද ගාස්තු අවස්ථා තුනකදී හෝ ඊට වැඩි ගණනකදී ගෙවීම පැහැර හැර ඇති අවස්ථාවකදී හා/හෝ

ඉහත 11 (iv) ව්‍යවස්ථාවට අනුව නීත්‍යානුකූල නොවන පරිදි දින තුනකට හෝ වැඩි කාලයක් වාහන ගාල් කරනු ලබන බිම්කඩක ගාල් කරනු ලැබූ අවස්ථාවකදී,

රෝද අගුලු දැමීමේ (Tyre Lock) පොදු අංගනයක් වෙත ගෙන යාම ක්‍රියාවලිය කොළඹ මහා නගර සභාව මගින් හෝ නාගරික කොමසාරිස් මගින් බලය පවරනු ලැබූ නියෝජිතයකු විසින් සිදු කරනු ලැබිය හැක. එසේ කිරීමේදී එම රථයේ රියදුරාගෙන් හෝ අයිතිකරුගෙන් හෝ අවසර ගැනීමක් අවශ්‍ය නොවන අතර එසේ කිරීමේදී එම වාහනයට හෝ ඉන් කොටසකට යම් අලාභයක් සිදු වුවහොත් ඒ සම්බන්ධව කොළඹ මහා නගර සභාව හෝ නාගරික කොමසාරිස්වරයා හෝ බලයලත් නියෝජිතයා කිසිදු වගකීමකට යටත් නොවිය යුතුය. රෝද අගුලු දැමූ අවස්ථාවකදී, අදාළ රියදුරු හෝ වාහනයේ අයිතිකරු විසින් ගෙවීමට ඇති සියලු ප්‍රමාද ගාස්තු හා සේවා ගාස්තු සියල්ල ගෙවා නිම කිරීමෙන් අනතුරුව පමණක් වාහනය මුදා හරිනු ලැබිය යුතු ය. එසේ ප්‍රමාද ගාස්තු හා සේවා ගාස්තු ගෙවා වාහනය මුදා හැරීමට අපොහොසත් වන අවස්ථාවකදී මංමාවත් සඳහා යම්කිසි බාධාවක් සිදු වන බැවින් එය එම ස්ථානයෙන් ඉවත් කර වෙනත් ස්ථානයකට ගෙන යාම හෝ තාවකාලික වාහන ගොඩගැසීමේ අංගනය වෙත ඉවත් කිරීම සිදු කරනු ලැබිය හැකි ය. එවන් අවස්ථාවකදී වාහනයට හෝ ඉන් කොටසකට සිදුවන අලාභයන් සම්බන්ධව සභාව හෝ බලයලත් නියෝජිතයා කිසිදු වගකීමකට යටතේ නොවිය යුතු ය.

13. පොලිස් නිලධරයෙකු, රථවාහන පාලකයකු නැතහොත් එම කාර්යය සඳහා නාගරික කොමසාරිස්වරයා විසින් බලය පවරන ලද තැනැත්තෙකු විසින්, වාහන ගාල් කර තැබීමේ පොදු බිම් කඩක ගාල් කර ඇති යම් මෝටර් වාහනයක රියදුරුගෙන් නැතහොත් අයිතිකරුගෙන් ඒ මෝටර් වාහනය වෙනුවෙන් නිකුත් කර ඇති අවසර පත්‍රය පරීක්ෂා කිරීම සඳහා ඉදිරිපත් කරන ලෙස ඉල්ලා සිටිනු ලැබූ කිනම් අවස්ථාවක වුවද, ඒ අවසර පත්‍රය එම අයිතිකරු හෝ රියදුරු හෝ විසින් එය ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

14. කිසියම් වාහන ගාල් කර තැබීමේ පොදු බිම් කඩක් කිසියම් නිශ්චිත පන්තියක හෝ වර්ගයක හෝ මෝටර් වාහන සඳහා වෙන් කරනු ලැබ ඇති අවස්ථාවක එම පන්තියට නැතහොත් වර්ගයට අයත් නොවන මෝටර් වාහනයක් එම බිම් කඩට ඇතුලු වීම හෝ එහි ගාල් කර තැබීම කරනු නොලැබිය යුතු ය.

15. වාහන ගාල් කර තැබීමේ පොදු බිම් කඩට ඇතුල් වන හෝ ඉන් පිටව යන හෝ වෙනත් මෝටර් වාහනයකට, බාධා වන ආකාරයට කිසිදු තැනැත්තෙකු විසින් වාහන ගාල් කර තැබීම කරනු නොලැබිය යුතු ය.

16. වාහන ගාල් කර තැබීමේ පොදු බිම් කඩට ඇතුලුවීම සහ පිටවීම සඳහා වෙනම මාර්ග සලසා ඒ බව දැන්වීමකින් හෝ සංඥා පුවරුවක් හෝ මගින් දක්වා ඇති අවස්ථාවක නියමිත අදාළ මාර්ගයෙන් හැර කිසිම මෝටර් වාහනයක් එම ස්ථානයට ඇතුලුවීම හෝ පිටවීම හෝ නොකළ යුතු ය.

17. වාහන ගාල් කර තැබීමේ කිසියම් පොදු බිම් කඩක මෝටර් වාහනයක් ගාල් කර තිබිය දී කිසියම් තැනැත්තෙකු විසින් එම වාහනය සේදීම හෝ සේදීමට සැලැස්වීම නොකළ යුතු ය.

18. වාහන ගාල් කිරීමේ පොදු බිම්කඩක වාහනය ගාල් කර තිබිය දී නාගරික කොමසාරිස්වරයාගේ විශේෂ අවසරයක් නොමැතිව වෙළඳාම් කටයුතු කිරීම, දැන්වීම් ප්‍රදර්ශනය කිරීම, ශබ්ද විකාශන යන්ත්‍ර හෝ වෙළඳාම් කටයුතු සඳහා කිසිම ශබ්ද විකාශනයක් භාවිතා කිරීම නොකළ යුතු ය.

19. කිසිදු තැනැත්තෙකු විසින් -

(i) වාහන ගාල් කිරීමේ පොදු බිම් කඩක් වෙතින් වාහනය ඉවත් කරගෙන යාමේ කාර්යය සඳහා, අලුත්වැඩියා කිරීම් සිදු කිරීම අත්‍යාවශ්‍ය නම් මිස වාහන ගාල් කර තැබීමේ පොදු බිම් කඩක ගාල් කර තබා ඇති යම් මෝටර් වාහනයක කිසියම් අලුත්වැඩියා කිරීමක් සිදු කිරීම නොකළ යුතු ය.

(ii) එවැනි යම් අත්‍යාවශ්‍ය අලුත්වැඩියාවක් සිදු කිරීමේ දී, මහජනයාට හිරිහැරයක් හෝ පීඩාවක් නොවන අයුරින් කටයුතු කළ යුතු යි.

20. වාහන ගාල් කිරීමේ පොදු බිම් කඩක ගාල් කර තිබෙන මෝටර් වාහනයක, කිසිම තැනැත්තකු විසින් -

(i) වාහනය ගාල් කර ඇති ස්ථානය මාරු කිරීමේ හෝ එම නැවතුම් පොළෙන් ඉවත්ව යාමේ හෝ වෙනත් අත්‍යාවශ්‍ය කරුණකදී එම කාර්යය සඳහා හැර, එහි එන්ජිම පණ ගැන්වීම සහ/හෝ ;

(ii) අනතුරක් වැළැක්වීමේ හෝ වාහනයෙහි නැතහොත් එහි තුළ සිටින්නන්ගේ ආරක්ෂාව තහවුරු කර ගැනීමේ හෝ කාර්යය සඳහා හැර, වාහනයේ සවිකර ඇති අනතුරු හැඟවීමේ උපකරණයක් නාද කිරීම ; නොකළ යුතු අතර සහ/හෝ

(iii) වාහන ගාල් කිරීමේ පොදු බිම්කඩ ඇතුළත, නොහික්මුණු, අසංවර, අසභ්‍ය හා/හෝ අශීලාචාර ආකාරයට හැසිරීම හෝ කිසියම් කරදරයක් සිදු කිරීම නොකළ යුතු ය.

21. නාගරික කොමසාරිස්වරයා විසින්, ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන නියමයක් මගින්, සතියේ කිසියම් දිනයක මෙම අතුරු ව්‍යවස්ථා ක්‍රියාත්මක නොවිය යුතු යැයි නිශ්චය කරනු ලැබිය හැකි ය ; එසේ නැතහොත්, මෙම අතුරු ව්‍යවස්ථා ක්‍රියාත්මක විය යුතු කාල වේලාවන් වෙනස් කරනු ලැබිය හැකි ය.

22. මෙම අතුරු ව්‍යවස්ථාවේ සඳහන් විධිවිධාන කඩ කරන සෑම තැනැත්තකුම වරදකට වරදකරු වන අතර මහේස්ත්‍රාත්වරයෙකු ඉදිරියේ පැවැත්වෙන ලඝු නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබීමේ දී,

(අ) පළමුවන වරට සිදු කරන වැරැද්දක් සම්බන්ධයෙන් රුපියල් එක් දහසක් නොඉක්මවන දඩයක් ; සහ

(ආ) දෙවන හෝ තදන්තර වරදක් සම්බන්ධයෙන් රුපියල් දෙදහසක් නොඉක්මවන දඩයක් ; සහ

(ඇ) නොකඩවා කෙරෙන වරදක් සම්බන්ධයෙන් වන විට, ඒ කඩ කිරීම සම්බන්ධයෙන් වරදකරු කරුණු ලැබීමකින් පසුව වරද නොකඩවා කෙරෙන සෑම දිනයක් සඳහාම රුපියල් දෙසිය පනහක් නොඉක්මවන අතිරේක දඩ මුදලකට යටත්වන්නේ ය, සහ

සේවා ගාස්තු ද ගෙවීමට යටත් වන්නේ ය.

23. මෙම අතුරු ව්‍යවස්ථාව බලාත්මක වීමත් සමග දැනට කොළඹ මහා නගර සභාව තුළ ක්‍රියාත්මක වන රථවාහන ගාල් කිරීම සම්බන්ධ 1941 මැයි 16 දිනැති අංක 8746 රජයේ ගැසට් පත්‍රය මගින් ද. 1942 මාර්තු 27 දිනැති අංක 8896 රජයේ ගැසට් පත්‍රය මගින් ද, 1948 සැප්තැම්බර් 10 දිනැති අංක 9902 රජයේ ගැසට් පත්‍රය මගින් ද, 1929 පෙබරවාරි 15 දිනැති අංක 7693 දරන ගැසට් පත්‍රය මගින් ද හා 1939 දෙසැම්බර් මස 22 දිනැති අංක 8561 දරන ගැසට් පත්‍රය මගින් ද ප්‍රසිද්ධ කරනු ලැබූ අතුරු ව්‍යවස්ථා ඇතුළු මෙතෙක් මේ සම්බන්ධයෙන් පනවා ඇති සියළු අතුරු ව්‍යවස්ථා මෙයින් පරිච්ඡින්න කොට අවලංගු කරනු ලැබේ.

24. වාහන ගාල් කර තැබීම සම්බන්ධව මෙම අතුරු ව්‍යවස්ථා ගැසට් පත්‍රයේ පළකරන ලද දින සිට වලංගු වේ.

25. මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවයක් ඇති වුවහොත් එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

### *උපලේඛනය I*

| | | වාහන නැවතුම් ගාස්තු පැයකට හෝ ඉන් කොටසක් සඳහා ගාස්තුව (රුපියල්) | වාහන නැවතුම් ගාස්තු මසකට හෝ ඉන් කොටසක් සඳහා ගාස්තුව (රුපියල්) |
|---|---|---|---|
| (i) | මෝටර් සයිකලක් සඳහා | 10.00 | |
| (ii) | මෝටර් ට්‍රයිසිකලය | 20.00 | |
| (iii) | මෝටර් රථයක් හෝ ද්විත්ව කාර්ය වාහන රථයක් සඳහා | 30.00 | |
| (iv) | බස් රථයක්, මෝටර් කෝච් රථය, ලොරි රථයක්, මෝටර් ලොරිය, සැහැල්ලු මෝටර් ලොරිය, බර මෝටර් ලොරිය | 50.00 | |
| (v) | පාසල් වෑන් රථයක් සඳහා මසකට හෝ ඉන් කොටසකට | | 600.00 |
| (vi) | පාසල් බස් රථයක් සඳහා මසකට හෝ ඉන් කොටසකට | | 1000.00 |

### *උපලේඛනය II*

| | *නීත්‍යානුකූල නොවන පරිදි වීථියක ගාල් කර තැබූ වාහනයක් සඳහා අදාළ ප්‍රමාද ගාස්තුව* | | |
|---|---|---|---|
| | *පළමු දිනයේ පැයකට හෝ ඉන් කොටසකට (රුපියල්)* | *දෙවන දින සිට දින 14 ක් සඳහා දිනකට හෝ ඉන් කොටසකට (රුපියල්)* | *ඉක්බිති කාලය සඳහා මසකට හෝ මසකින් කොටසකට (රුපියල්)* |
| මෝටර් සයිකල් සඳහා | 20/- | 360/- | 5,000/- |
| මෝටර් ට්‍රයිසිකලය සඳහා | 40/- | 720/- | 10,000/- |
| මෝටර් රථයක් හෝ ද්විත්ව කාර්ය වාහන රථයක් සඳහා | 60/- | 1,080/- | 15,000/- |
| බස් රථයක්, මෝටර් කෝච් රථය, ලොරි රථයක්, මෝටර් ලොරිය, සැහැල්ලු මෝටර් ලොරිය, බර මෝටර් ලොරිය | 100/- | 1,800/- | 25,000/- |

*උපලේඛනය **II** (සම්බන්ධිතයි)*

| | *නීත්‍යානුකූල නොවන පරිදි වීථියක ගාල් කර තැබූ වාහනයක් සඳහා අදාළ ප්‍රමාදගාස්තුව* | | |
|---|---|---|---|
| | *පළමු දිනයේ පැයකට හෝ ඉන් කොටසකට (රුපියල්)* | *දෙවන දින සිට දින 14 ක් සඳහා දිනකට හෝ ඉන් කොටසකට (රුපියල්)* | *ඉක්බිති කාලය සඳහා මසකට හෝ මසකින් කොටසකට (රුපියල්)* |
| පාසල් වෑන් රථයක් සඳහා | 40/- | 500/- | 7,000/- |
| පාසල් බස් රථයක් සඳහා | 60/- | 850/- | 12,000/- |

ව්‍යවස්ථා අංක 11 (vii) අනුව හිඟ මුදල් අය කර ගැනීම සඳහා නඩු පැවරීම මාස තුනක් ඉක්මගිය පසුව හෝ ප්‍රමාද ගාස්තුව රුපියල් 50,000/- ක් හෝ එය ඉක්ම වූ විට සිදු කරනු ලබයි.

08 - 368

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.